# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1694/28 – 2011 පෙබරවාරි 25 වැනි සිකුරාදා – 2011.02.25

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/11/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

කේ. එස්. මුණසිංහ මයා, අංක 86 F, බටහිර කලුවාරිප්පුව, කටාන.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

දෙහිවල, ඇතුලු වැන්ඩවර්ට් පෙදෙස, අංක 12 හි, ඩබ්. ජී. ඩීන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ 05,
කම්කරු මහලේකම් කාර්යාලයේ දී ය.

1A – G 14202– 350 (2011/02)

මගේ අංකය: IR/22/11/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. එස්. මුණසිංහ මයා, අංක 86 F, බටහිර කලුවාරිප්පුව, කටාන.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මීගමුව ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටියදී 2008.11.17 දින සිට කේ. එස්. මුණසිංහ මහතාගේ වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් ගම්පහ ප්‍රාදේශිකයේ ජ්‍යෙෂ්ඨ විනය නිලධාරිගේ විනය නියෝගය හා අනතුරුව එහි අභියාචනා මණ්ඩල සභාපතිගේ අභියාචනා නියෝගය හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳවද වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

03 - 366

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.